## 2. SET ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට උපදෙස් - 2021/2022

**I.** එක් එක් ආදායම් ප්‍රභවයන්ගේ **ඇස්තමේන්තුගත ආදායම්** ප්‍රමාණය SET ආකෘති පත්‍රයේ (10), (20), (30) හා (40) කොටුවල සඳහන් කරන්න.

### II. 50 ව කොටුව - ඇස්තමේන්තුගත තක්සේරු කළ හැකි ආදායම

අ) යම් තැනැත්තෙකුගේ ඇස්තමේන්තුගත තක්සේරු කළ හැකි මුළු ආදායම වනුයේ එම තැනැත්තාගේ සේවානියුක්තියෙන්, ව්‍යාපාරයකින්, ආයෝජනයකින් (ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලැබීම් හැර) හෝ වෙනත් ආදායම් මූලාශ්‍රයකින් වන මුළු ඇස්තමේන්තුගත ආදායමයි.

ආ) ඇස්තමේන්තුගත තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී, අවසාන රඳවාගැනීමේ ගෙවීම් සහ නිදහස් කළ මුදල් ප්‍රමාණයන් ඇතුළත් නොකළ යුතුය.

### III. 60 ව කොටුව - ඇස්තමේන්තුගත සුදුසුකම් ලබන මුළු ගෙවීම්

වර්ෂය තුළ සිදු කිරීමට නියමිත සුදුසුකම් ලබන ගෙවීම්වල මුළු ප්‍රමාණය ඇතුළත් කරන්න. [දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සවිස්තරාත්මක උපදෙස්වල 2(III) අයිතමය]

### IV. 70 ව කොටුව - ඇස්තමේන්තුගත ලබන මුළු සහන

වර්ෂය සඳහා සුදුසුකම් ලබන සහනවල මුළු ප්‍රමාණය ඇතුළත් කරන්න. [දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සවිස්තරාත්මක උපදෙස්වල 2(IV) අයිතමය බලන්න.]

### V. 90 ව කොටුව - ඇස්තමේන්තුගත බදු බැදියාව

අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණ අදාළ කරගනිමින් ඇස්තමේන්තුගත බදු බැදියාව ගණනය කළ යුතුය. පළමුව SET ප්‍රකාශයේ II වන කොටස පුරවා 90.10 කොටුවේ වටිනාකම 90 වන කොටුවට ඇතුළත් කරන්න. [දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සවිස්තරාත්මක උපදෙස්වල 2(VI) අයිතමය බලන්න.]

### VI. 100 වන කොටුව - ඇස්තමේන්තුගත විදේශ බදු බැර

යම් ඇස්තමේන්තුගත විදේශ බදු බැරක් තිබේ නම් 100 වන කොටුවට ඇතුළත් කරන්න. විදේශ බදු බැර හා සම්බන්ධ වන ලාභවල හෝ ආදායම් කොටස මත ගණනය කරන ලද බදු ප්‍රමාණයට විදේශ බදු බැර සීමා වේ.

### VII. 110 වන කොටුව - ඇස්තමේන්තුගත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ.)

ඇස්තමේන්තුගත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දට යටත් වන සේවානියුක්තිකයෙකුගේ සේවානියුක්තියෙන් ලැබෙන ආදායම 110 වන කොටුවට ඇතුළත් කළ යුතුය.

## 3. ත්‍රෛමාසික ආදායම් බදු වාරික ගෙවීම් ගණනය කිරීම

**I.** ත්‍රෛමාසික වාරික ගෙවීම් පහත සඳහන් සූත්‍රයට අනුව ගණනය කළ යුතුය.

$$\text{ත්‍රෛමාසික වාරික ගෙවීම } \mathbf{(E)} = \frac{A - C}{B}$$

**A** ඇස්තමේන්තුගත ගෙවිය යුතු බද්ද (120 වන කොටුවේ ප්‍රකාශ කර ඇති ප්‍රමාණය)

**B** වර්තමාන වාරිකයද ඇතුළත්ව ගෙවීමට ඉතිරිව ඇති වාරික ගණන *

**C** මෙම වාරිකයට පෙර කර ඇති බදු ගෙවීම (පෙර වාරික ගෙවීම/ වර්තමාන වාරිකය ගෙවීමට නියමිත දිනයට පෙර ගෙවන ලද/ රඳවා ගන්නා ලද රඳවා ගැනීමේ බදු (WHT)/ අත්තිකාරම් ආදායම් බද්ද (AIT)

**** වර්තමාන වාරිකයද ඇතුළත්ව ගෙවීමට ඉතිරිව ඇති වාරික ගණන - B***

| ***වාරිකය*** | ***1*** | ***2*** | ***3*** | ***4*** |
|---|---|---|---|---|
| ***"B"*** | *4* | *3* | *2* | *1* |

**II. ශුද්ධ ත්‍රෛමාසික වාරික ගෙවීම ගණනය කිරීම (E-F)**

**F** - ත්‍රෛමාසික වාරික ගෙවීම්වල අත්තිකාරම් ගෙවීම්, 2019/2020 තක්සේරු වර්ෂයේ (Y/A) ආර්ථික ගාස්තු ප්‍රමාණය හෝ හවුල් ව්‍යාපාරය මගින් ගෙවන ලද වාරික කොටස (හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සඳහා).

## 4. දණ්ඩන විධිවිධාන

### 4.1 SET ආකෘති පත්‍ර ප්‍රමාද වී ගොනු කිරීම හා ඉදිරිපත් නොකිරීම හා වැරදි හෝ නොමග යවන සුළු SET ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා වන දණ්ඩන විධිවිධාන

– SET ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන පුද්ගලයකු රුපියල් මිලියනයක් දක්වා වූ දඩයක් ගෙවීමට යටත් වනු ලැබිය හැකිය.

– වැරදි SET ආකෘති පත්‍රයක් හේතුවෙන් හා SET ආකෘති පත්‍රයේ වැදගත් දෙයක් අතහැර තිබීම හේතුවෙන් බදු මුදලක් අඩුවෙන් ගෙවන ලද විටෙක දණ්ඩනය පහත සඳහන් ප්‍රමාණයට පනවනු ලැබේ.

– (අ). (ආ) කොටස අදාළ නොවන්නේ නම්, අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 25%:

හෝ

(ආ). අඩුවෙන් කරන ලද ගෙවීම -

– රුපියල් මිලියන දහයකට වඩා වැඩි වන්නේ නම්; හෝ

– අදාළ කාලසීමාව සඳහා එම තැනැත්තාගේ බදු බැඳීමෙන් 25% වඩා වැඩිවන්නේ නම්,

එසේ අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 75% ක ප්‍රමාණයක දණ්ඩනයකට යටත් විය යුතුය...

– මෙම SET ආකෘති පත්‍රය බදු නිලධරයකුට කරන ලද ප්‍රකාශයක් සේ සලකනු ලබන අතර ඒ අනුව, අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශයක් මත දණ්ඩනයක් පනවනු ලැබිය හැකි අතර එම දණ්ඩනය අඩුවෙන් කරන ලද ගෙවීම් ප්‍රමාණය හෝ රුපියල් පනස් දහස යන අගයන්ගෙන් වඩා වැඩි අගය වන්නේය.

– SET ආකෘති පත්‍රය චේතනාන්විතව අසත්‍ය හෝ නොමඟ යවන සුළු ලෙස සකස් කරනු ලබන යම් තැනැත්තෙකු රුපියල් මිලියනයක් දක්වා දඩයකට වැරදිකරු කිරීම හෝ වසරක කාලයක් දක්වා බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකකටම යටත් කළ හැකිය.

**4.2 වාරික නොගෙවීම/ප්‍රමාදවී ගෙවීම/අඩුවෙන් ගෙවීම සහ වාරික ගෙවීම පැහැර හැරීම සඳහා අදාල වන්නාවූ දණ්ඩන විධිවිධාන.**

- **බදු නොගෙවීම/ප්‍රමාදවී ගෙවීම හෝ අඩුවෙන් ගෙවීම සඳහා දණ්ඩනය.**

  මෙම පනත යටතේ ගෙවීමට අවශ්‍යවන්නා වූ වාරිකය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක්, වාරිකය ගෙවීමට නියමිත දිනයේ සිට දින 14 ක් ඇතුළත ගෙවීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු එසේ ගෙවා නොමැති බදු මුදලින් 10% කට සමාන වන ප්‍රමාණයක දණ්ඩනයකට යටත් වන්නේය.

- **වාරික ගෙවීම පැහැර හැරීම.**

  SET ආකෘති පත්‍රයේ දක්වා ඇති ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු අඩුවෙන් සඳහන් කර චේතනාන්විතව වාරික ගෙවීම පැහැර හරින්නා වූ යම් පුද්ගලයකු රුපියල් මිලියන 10 ක් දක්වා දඩයකට වරදකරු වීම හෝ අවුරුදු 2 ක් දක්වා කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

- **වාරික අඩුවෙන් ගෙවීම මත පොළිය**

  නියමිත දිනයේදී වාරිකය හෝ එහි කොටසක් ගෙවා නොමැති අවස්ථාවකදී 1.5% පොළියක් මාස්පතා හෝ මසකින් කොටසකදී එම පැහැරහරින ලද වාරිකය හෝ වාරිකයෙන් කොටසක් සඳහා අය කළ හැක.

## උපදෙස් තවදුරටත්

තවදුරටත් උපදෙස් ලබා ගැනීම සඳහා, කරුණාකර "ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය පිළිබඳ විස්තරාත්මක උපදෙස්" වෙත යොමුවන්න. ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ www.ird.gov.lk වෙබ් අඩවිය බාගත කළ හැකිය.

**යම් ගැටළුවක් ඇත්නම් පහත දුරකථන අංක අමතා වැඩි විස්තර ලබාගත හැකිය.**

1. 1944 - දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානය
2. 011-2134200 - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - බදු උපදේශන අංශය
3. 011-2134251 - කොමසාරිස් - බදු උපකාරක සහ ප්‍රවර්ධන අංශය
4. 011-2134250 - කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
5. දේශීය ආදයම් සියලුම නගරබද සහ ප්‍රාදේශීය කාර්යාලවල කොමසාරිස්වරු